# 1 දේව ස්වරූපයෙන් නිමැවුණු මිනිසා



**උත්පත්ති 1:26-27, 2:9**

අලුත් වසරක්! අලුත් පංතියක්!
අට වන ශ්‍රේණියට උසස් කරනු ලැබ සිටින දරුවන්, නව වසරෙහි ක්‍රිස්තියානි ධර්මය විෂයය හදරන පළමු දිනය අද වේ.

සුබ උදෑසනක් වේවා දරුවනේ ඔබ සැමට. එසේ ම සුබ නව වසරක් වේවා!

මෙලෙස සුබ පතමින් ගුරුතුමිය පංතියට පිවිසුණා ය.

ඔබතුමියටත් එසේ ම වේවා!

මෙලෙස පිළිවදන් දෙමින් දරුවෝ ද ගුරුතුමියට සුබ පැතුවෝ ය.

ගුරුතුමිය : අද පාඩම ආරම්භ කරන්නට පළමුවෙන් මා මේ දරුවන්ගෙන් ප්‍රශ්නයක් අසනවා. හොඳින් සිතා බලා පිළිතුරු දෙන්න. ප්‍රශ්නය මෙයයි. "මෙලොව ඔබ දකින වඩාත් විස්මිත නිර්මාණය කුමක් ද?"

පැතුම් : එවැනි නිර්මාණ කිහිපයක් ම මගේ සිහියට එනවා. පරිගණකය, අභ්‍යවකාශයානා, සබ්මැරීන් වගේ නිර්මාණ.....

බුද්ධික : "ලෝකයේ පුදුම හත" ලෙස නම් කර තිබෙන නිර්මාණ තමයි මා දන්නා තරමින් ලෝකයේ තිබෙන විස්මිත ම නිර්මාණ.

සෙසු දරුවන්: ඇයි! දුරකථන, රොබෝ යන්ත්‍ර.

ගුරුතුමිය : හොඳයි! නිර්මාණි ඇයි බර කල්පනාවක?

නිර්මාණි : මේ සඳහන් කළ සියලු දේ විස්මිත නිර්මාණ තමයි. එහෙත් ඒ සියල්ල නිර්මාණය කිරීමට මුල් වන්නේ මනුෂ්‍යයා නේද? ඒ නිසා මා නම් සිතන්නේ මෙලොව පවත්නා විස්මිත ම නිර්මාණය මනුෂ්‍යයා කියලයි.

ගුරුතුමිය : බොහොම හොඳයි! නිර්මාණිගේ පිළිතුර නිවැරැදියි. මෙලොව විස්මිත නිර්මාණ අතර අසමසම නිර්මාණය තමයි මනුෂ්‍යයා.
එසේ නම් ඔබට කිව හැකි ද මනුෂ්‍යයා නිර්මාණය කරන ලද්දේ කවුරුන් විසින් ද කියලා?

නිර්මාණි : මනුෂ්‍යයා නිර්මාණය කරන ලද්දේ දෙවි සමිඳාණන් වහන්සේ විසින්.

ගුරුතුමිය : බොහොම හරි. අපි ශුද්ධ බයිබලයෙන් ඒ පිළිබඳ ව තව දුරටත් කියවා බලමු.

*ඉන්පසු දෙවියන් වහන්සේ; අපගේ ස්වරූපය අනුව, අපගේ සමානත්වය ලෙස මනුෂ්‍යයා මවමු..... ඔහු මුහුදේ මසුන් ද අහසේ පක්ෂීන් ද ගව මහීෂයන් ද මුළු පොළෝ තලයෙහි සියලු වන මෘගයන් ද උරගයන් ද පාලනය කෙරේවා! යි අණ කළ සේක.*

(උත්පත්ති 1 : 26)

මෙලෙස දෙවියන් වහන්සේ විසින් අප මවන ලද බව ශුද්ධ බයිබලයේ පැහැදිලි ව සඳහන් වේ. දේව මැවිල්ල තුළ, ජීවය ඇති - ජීවයක් නොමැති සියල්ලේ මැවුම්කරුවාණෝ දෙවි සමිඳාණන් වහන්සේ ම ය. නමුත් විශේෂත්වය වන්නේ දේව මැවිල්ල තුළ එක් මැවිල්ලක් වන මනුෂ්‍යයාහට උන්වහන්සේ විසින් අසමසම ස්ථානයක් හිමිකර දීම වේ. එනම්, තමන් වහන්සේගේ ස්වරූපය අනුවත් උන්වහන්සේට සමාන ලෙසත් දෙවි සමිඳාණන් වහන්සේ විසින් මනුෂ්‍යයා මවනු ලැබීම වේ.

දෙවි සමිඳාණන් වහන්සේ විසින්, තම මැවිල්ල තුළ මෙලෙස මනුෂ්‍යයාට අසමසම ස්ථානයක් හිමිකර දෙනු ලැබුයේ මන්ද? ඒ උන්වහන්සේ අප කෙරෙහි දක්වූ අසීමිත ප්‍රේමය නිසා ම නොවේ ද?

එසේ ය! තමන් වහන්සේගේ ම ස්වරූපය අනුවත් - සමානත්වයටත් අප මවනු ලැබීමෙන් දෙවි සමිඳාණන් වහන්සේ තුළ අප කෙරෙහි පවත්නා ප්‍රේමයේ ගැඹුර වටහා ගත හැකි වේ.

එසේ නම්, අප කෙරෙහි අසීමිත ලෙස ප්‍රේම කරන දෙවි සමිඳාණන් වහන්සේ වෙනුවෙන් පෙරලා ප්‍රේමය දැක්වීම අපගේ යුතුකම හා වගකීම නොවන්නේ ද?

අප කෙලෙස ද දෙවි සමිඳාණන් වහන්සේට අපගේ ප්‍රේමය දැක්විය යුතු වන්නේ? එය කළ හැකි වන්නේ දේව කැමැත්ත ඉටු කිරීමට අප නිරතුරු ව උත්සාහ ගැනීමෙනි.

**දේව කැමැත්ත ඉටු කිරීම උදෙසා අප කුමක් කළ යුතු ද?**
ඒ උදෙසා අපි....

- අප මවන ලද ප්‍රේමණීය දෙවි පියාණන් කෙරෙහි අපගේ පූර්ණ විශ්වාසය හා ඇදහිල්ල රඳවමු.
- දේව මැවිල්ලේ පාලනය මනුෂ්‍යයා වෙත පවරන ලද හෙයින් අපි දේව මැවිල්ලේ දයාද සුරක්ෂිත කිරීමේ හා වර්ධනය කිරීමේ භාරකරුවන් ලෙස ක්‍රියා කරමු.
- දේව මැවිල්ල තුළ අසමසම වටිනාකමක් මනුෂ්‍යයාට උරුමකර දුන් හෙයින් අපගේ ජීවිතවල වටිනා බව තේරුම් ගනිමු.
- දේව ගුණාංග තුළ අපගේ ජීවිත සුරක්ෂිත කර ගනිමු.
- ශාරීරික ව ද මානසික ව ද ආධ්‍යාත්මික ව ද අපහට ලබා දුන් නිදහස යුතු ලෙස භාවිත කරමු.
- දේව ප්‍රේමය අපගේ ජීවිතවලට අදාළ කර ගනිමින්, ජීවිතාදර්ශයෙන් එය අන්‍යයන් වෙත ද පතුරුවාලමු.

මනුෂ්‍යයා කෙරෙහි දක්වන ලද මහත් ප්‍රේමය නිසා ම තම ස්වරූපයට හා සමානත්වයට නිර්මාණය කරමින් මනුෂ්‍යයාහට අසමසම වටිනාකමක් ලබා දුන් දෙවි සමිඳාණන් වහන්සේ **"...ඔහු මුහුදේ මසුන් ද අහසේ පක්ෂීන් ද ගව මහීෂයන් ද මුළු පොළෝ තලයෙහි සියලු වන මෘගයන් ද උරගයන් ද පාලනය කෙරේවා!"**යි අණ කරමින් සමස්ත දේව මැවිල්ලේ පාලනය මනුෂ්‍යයා වෙත බාර කළ සේක. තව ද සියලු සම්පතින් පරිපූර්ණ ව නිර්මාණය කරන ලද ඒදන් උයන රැකබලා ගැනීමේ වගකීම නැතහොත් භාරකාරත්වය ද මනුෂ්‍යයා වෙත පවරා දුන් ආකාරය අපි ශුද්ධ බයිබලයෙන් හඳුනා ගනිමු.

> ***තව ද උන්වහන්සේ දැකුම්කලු, ප්‍රණීත පල දෙන සියලු ගස් ද උයන මැද ජීවන වෘක්ෂය ද හොඳ නරක අවබෝධ කර ගැනීමේ ගස ද භූමියෙන් හට ගන්නට සැලැස්වූ සේක.***
> *(උත්පත්ති 2 : 9)*

මෙලෙස මනුෂ්‍යයාහට තෘප්තිමත් ජීවිතයක් ගත කිරීම උදෙසා දැකුම්කලු පරිසරයක් ද පෝෂණය සඳහා ප්‍රණීත පල සහිත ගස් ද මවා වදාළ සේක.

මෙහි දී අවධාරණය කර ගත යුතු වැදගත් කරුණ වන්නේ මනුෂ්‍යයා දේව මැවිල්ලේ භාරකරු මිස අයිතිකරු නොවන බව ය. මැවිල්ල අයත් වන්නේ දෙවි සමිඳාණන් වහන්සේට ය. උන්වහන්සේ මිනිසාට ජීවත්වීම උදෙසා අවශ්‍ය සියලු සම්පත් දේව මැවිල්ල තුළ ස්ථාපිත කර එය නිසි ලෙස භුක්ති විඳිමින් පවත්වාගෙන යාමේ වගකීම මනුෂ්‍යයා වෙත පැවරූ සේක. අතීතයේ ජීවත් වූවෝ මෙම දේව මැවිල්ලේ දයාද භුක්ති වින්දහ.

වර්තමානයේ අපි ද දේව මැවිල්ලේ දයාද භුක්ති විඳිමින් ජීවත් වෙමු. එහෙයින් අනාගතයේ ජීවත් වීමට නියමිත සියල්ලන්හට ද මැවිල්ලේ දයාද උරුම කර දීම අපගේ වගකීම වේ. ඒ සඳහා පවත්නා සම්පත් අරපිරිමැස්මෙන් හා වර්ධනය කරමින් භාවිත කිරීම අපගේ යුතුකම මෙන් ම වගකීම ද වන්නේ ය.

දේව මැවිල්ලේ දයාද සුරක්ෂිත කිරීමේ භාරකරුවන් ලෙස අපගේ වගකීම පිළිබඳ ව නැවත නැවතත් අවධාරණය කළ යුතු ව ඇත්තේ, මනුෂ්‍යයාගේ ආත්මාර්ථකාමී පරිභෝජන රටාව තුළ සිදුවන සම්පත් නාස්තිය නිසා ය. දේව මැවිල්ලේ දයාද සැම මනුෂ්‍යයෙකුට ම සමාන ලෙස උරුම වේ. නමුත් අද ලොව පිරිසක් මන්දපෝෂණයෙන් හා කුසගින්නෙන් මියැදෙද්දී තව පිරිසක් අධිපෝෂණයෙන් පෙළෙති. දේව කැමැත්ත මෙය නොවේ. පවත්නා සම්පත් සාධාරණ ලෙස බෙදා ගනිමින් භුක්ති විඳීමේ ක්‍රමවේදයක් මනුෂ්‍යයා විසින් ම නිර්මාණය කරගත යුතු ව ඇත්තේ එහෙයිනි.

**ක්‍රියාකාරකම**

"මනුෂ්‍යයා දේව මැවිල්ලේ භාරකරු මිස අයිතිකරු නොවේ"

1. දේව මැවිල්ලේ අයිතිකරු ලෙස සිතා ක්‍රියා කරමින්, මනුෂ්‍යයා දේව මැවිල්ලට සිදු කරන හානි තුනක් දක්වන්න.
2. දේව මැවිල්ල තුළ ඔබගේ ජීවිතයේ වටිනා බව ඔබ අත්දකින්නේ කෙසේ ද?